**නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------------------------------**

නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය අතර 2017 ජූලි 07 දින එළඹි අංක එස්එල්පී 116 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ජීවනෝපායන් සංවර්ධනය කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,410 ක් වන අතර ඉන් රු.මිලියන 17,185 කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති සංදේශයේ ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයට අනුව උතුරු, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත්වල ග්‍රාමීය මාර්ග ඉදිකිරීම් සහ පුනරුත්ථාපන සඳහා උප ව්‍යාපෘති 224 ක්, වාරි මාර්ග පද්ධති ඉදිකිරීම් සහ පුනරුත්ථාපන සඳහා උප ව්‍යාපෘති 221 ක් සහ ජලසැපයුම් යෝජනා ක්‍රම සඳහා උප ව්‍යාපෘති 73 ක් යටතේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, උපදේශකවරයකු පත්කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

### 2.2 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටළු

| විගණන ගැටළුව | | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2017 සැප්තැම්බර් 08 | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් | මෙම තනතුරු සඳහා තෝරා ගන්නා ලද නිලධාරින් සේවයට වාර්තා කර නොතිබුණි. | ක්‍රියාවලිය කාර්යක්ෂමව හා විචක්ෂණශීලී ආකාරයට |

| | | | | |
|---|---|---|---|---|
| | දින ජොෂ්ය ඉංජිනේරු, ප්‍රසම්පාදන විශේෂඥ තනතුරු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ එම තනතුරු පුරප්පාඩුව පැවතුණි. | සිදුවීම. | මෙම පුරප්පාඩු තනතුරෙහි රාජකාරී ව්‍යාපෘති කළමනාකරු සහ නියෝජ්‍ය ව්‍යාපෘති කළමනාකරු විසින් සිදුකරනු ලැබේ. | ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියකු සිටිය යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2016 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව, ව්‍යාපෘති කළමනාකරු විසින් සේවකයින්ගේ රාජකාරී නිසි පරිදි පවරා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සේවක කාර්ය සාධන ඇගයීම සිදුකර නොතිබුණි. | ඉලක්ක අත්කර ගැනීමට සේවකයින්ගේ දායකත්වය මැනීමට නොහැක. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසු රාජකාරී ලැයිස්තු නිලධාරින්ට නිකුත් කර ඇත. | අත්පත්කර ගැනීම් මැනීම සඳහා නිලධාරින්ගේ කාර්යසාධනය ඇගයීමට පියවර ගත යුතුය. |

## 2.3 පද්ධති හා පාලනයන්

| **විගණන ගැටළුව** | **බලපෑම** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 2 කට වරක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය නිසියාකාරව ක්‍රියාත්මක නොවේ. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවූ අතර රැස්වීම් අඩු ප්‍රමාණයක් පවත්වා ඇත. | ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචනය කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් නිතිපතා පැවැත්වීම අවශ්‍ය වේ. |